සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2016**

| දේශපාලන විද්‍යාව I<br>அரசியல் விஞ்ஞானம் I<br>Political Science I | 23 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |
|---|---|---|

**උපදෙස්:**
- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**
- ※ එක් පිළිතුරකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100**කි.

● අංක **1** සිට **15** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරෙන් **එකක්** සාවද්‍ය වේ. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

**1.** දේශපාලන විද්‍යාව සැලකිලිමත් වන අධ්‍යයන කරුණු වන්නේ:
(1) සීමාවන්ට යටත් කරන ලද සමාජ බලය ක්‍රියාවට නංවන ආකාරය
(2) සමාජ බලයේ ස්වභාවය සහ ඒ කෙරෙහි බලපාන සීමා උත්පාදනය වන මූලාශ්‍ර
(3) සමාජ බලය ක්‍රියාවට නැංවීමේ උපකරණ සහ විධික්‍රම
(4) සමාජ බලය ක්‍රියාවට නැංවීම හා සම්බන්ධ ක්‍රියාකාරීන් සහ බලධාරී ආයතන
(5) සමාජ බලය ක්‍රියාවට නංවන ක්‍රියාකාරිකයින්ගේ පෞද්ගලික චර්යාව

**2.** දේශපාලනය:
(1) දේශපාලන බලය හා එහි භාවිතය පිළිබඳ ගැටුම හෙවත් තරගකාරීත්වය
(2) කවුරුන්, කුමක්, කුමන අවස්ථාවක දී, කෙලෙස හිමිකර ගන්නවා ද යන්න හා සම්බන්ධ ක්‍රියාදාමය
(3) පොදු කරුණු හා සම්බන්ධව පැන නගින ගැටුම්කාරී අදහස්වල අවසාන ප්‍රතිඵලය
(4) තම පව්කාර ජීවිතයෙන් මිදීමට මිනිසුන්ට ඇති මාවත
(5) උණ්ඩයෙන් හෝ ඡන්දයෙන් ක්‍රියාවට නැංවෙන බල අරගලය

**3.** දේශපාලන විද්‍යාව, විද්‍යාවකට වඩා කලාවක් ලෙස සලකනු ලබන්නේ:
(1) අවුරුදු 2500ක් පමණ වූ දිගු ඉතිහාසය
(2) පර්යේෂණ පැවැත්වීම සඳහා විද්‍යාගාර ශිල්පක්‍රම භාවිත කිරීමට ඇති නොහැකියාව
(3) විෂය අධ්‍යයනය කිරීම සඳහා ඒකීය විධික්‍රම හා මූලධර්ම නොමැති වීම
(4) නිශ්චිත අවසාන නිගමනවලට එළඹිය හැකි නොවරදින සුළු භෞතික පදනමක් නොමැති වීම
(5) හේතුව සහ ප්‍රතිඵලය අතර නිශ්චිත සම්බන්ධතාවක් නොමැති වීම

**4.** රාජ්‍යය:
(1) විශේෂිත දේශපාලන ව්‍යුහයන්ගෙන් සමන්විත දේශපාලන සංවිධානයක් වේ.
(2) සෑම සමාජ විද්‍යාවක ම පදනම් සංකල්පය වේ.
(3) පොදු ආශාවන් යන ආවරණය යටතේ අනෙක් සෑම සමාජ සංවිධානයකටම ඉහළින් සිටින උත්තරීතර දේශපාලන සංවිධානය වේ.
(4) ජාත්‍යන්තර දේශපාලනයේ ප්‍රධාන ක්‍රියාකාරිකයා වේ.
(5) ප්‍රභවය සහ ස්වභාවය විවිධ දේශපාලන ගුරුකුල විසින් විවිධාකාරයට දැක ඇත.

**5.** ස්වාධිපති බලය:
(1) රාජ්‍යයට පමණක් හිමිකම් කිවහැකි උත්තරීතර බලය වේ.
(2) අසහාය මෙන් ම අසීමිත බලයක් ලෙස සැලකේ.
(3) මිනිස් සමාජයක් රාජ්‍ය ලෙස සැලකීම සඳහා අවශ්‍යයෙන් ම තිබිය යුතු මූලිකාංගය වේ.
(4) 1648 වෙස්ට්පේලියා සාම සමථය විසින් රාජ්‍යයන්ට පවරන ලද බලය වේ.
(5) රාජ්‍ය වීම නිසා ම රාජ්‍යයට හිමිවන සුවිශේෂී බලය වේ.

[දෙවැනි පිටුව බලන්න.

**6.** ආණ්ඩුව:
(1) රාජ්‍යයේ පොදු ආශාවන් ක්‍රියාවට පරිවර්තනය කරන රාජ්‍ය හස්තය වේ.
(2) ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය යනුවෙන් හැඳින්වෙන අංශ තුනෙන් සමන්විත වේ.
(3) රාජ්‍ය බලය ක්‍රියාවට නංවන පුද්ගල කණ්ඩායම වේ.
(4) එහි කාර්ය වෙනුවෙන් ජනතාවට වගකීමට බැඳී සිටින බව පොදුවේ පිළිගනී.
(5) වෙනස් කළ නොහැකි ස්ථාවර දෙයක් වේ.

**7.** ව්‍යවස්ථාදායකය:
(1) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ අත්‍යවශ්‍ය අංගයක් වේ.
(2) ඒකමාණ්ඩලික හෝ ද්විමාණ්ඩලික පදනම මත සංවිධානය වී ඇත.
(3) ආණ්ඩුවට සුජාතභාවය සපයන ප්‍රධාන ආණ්ඩුක්‍රම ආයතනය වේ.
(4) දේශපාලන පක්ෂ විසින් තෝරා පත්කරන සාමාජිකයින්ගෙන් පමණක් සමන්විත වේ.
(5) තත්ත්වයෙන් හා වරප්‍රසාදවලින් එක හා සමාන සාමාජිකයින්ගෙන් යුක්ත වේ.

**8.** විධායකය:
(1) ආණ්ඩු යාන්ත්‍රණය මෙහෙය වන ප්‍රධාන ධාවකයා වේ.
(2) රාජ්‍යයේ ප්‍රධානියාගෙන් සහ අමාත්‍යවරුන්ගෙන් සමන්විත වේ.
(3) ඕනෑම දේශපාලන ක්‍රමයක දේශපාලන පිරමිඩයේ ඉහළ ම නිලය වේ.
(4) ප්‍රජාතන්ත්‍රවාදය යටතේ සංවිධානය කරන්නේ ජනාධිපති, අර්ධ ජනාධිපති සහ කැබිනට් වශයෙනි.
(5) රාජ්‍යයේ උත්තරීතර නීති සම්පාදනය කරන ආණ්ඩුවේ බලධාරී අංශය වේ.

**9.** අධිකරණය:
(1) රාජ්‍යයේ නීති ක්‍රියාවට නැංවීම සඳහා ආණ්ඩුව විසින් යොදා ගැනෙන උපකරණය වේ.
(2) දේශපාලන ක්‍රමයක පවතින උසාවි පද්ධතිය වේ.
(3) රාජ්‍ය නීති අර්ථකථනය කරන ආයතනය වේ.
(4) සාමාන්‍යයෙන් ඉහළ උසාවි හා පහළ උසාවි වශයෙන් මට්ටම් දෙකක් අනුව සංවිධානය කෙරේ.
(5) පුද්ගල අයිතිවාසිකම්වල භාරකරුවා සහ ආරක්ෂකයා ලෙස සැලකේ.

**10.** නීතිය:
(1) රාජ්‍ය විසින් එහි සාමාජිකයින්ගේ හැසිරීම පිළිබඳ ව දක්වන සාමාන්‍ය නියම වේ.
(2) යම් පිළිවෙතකට අනුව සෑමවිට ම ලේඛනගත කිරීම සහ වාර්තාගත කිරීම කරනු ලැබේ.
(3) සිවිල් සමාජයේ කැමැත්ත සහ අනුමැතිය සහිත ව රාජ්‍ය විසින් බලාත්මක කරනු ලැබේ.
(4) සුවිශේෂී අවස්ථාවන්හි දී හැරුන විට සියලු දෙනාට ම සමාන ව යෙදවේ.
(5) කඩකළ විට දඬුවමට යටත් වේ.

**11.** බලතල බෙදීමේ න්‍යාය මගින් අවධාරණය කරන්නේ:
(1) ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණ වශයෙන් ආණ්ඩුවේ කාර්ය ත්‍රිවිධාකාර වන බව ය.
(2) ආණ්ඩුවේ කාර්ය ක්‍රියාවට නැංවීම එකිනෙකට වෙනස් පුද්ගලයින්ගෙන් සමන්විත ආයතන විසින් කළ යුතු බව ය.
(3) ඒ ඒ අංශයේ ක්‍රියාකාරිත්වය ඒවාට පැවරී ඇති විෂය පථයට පමණක් සීමා විය යුතු බව ය.
(4) ජනතාවගේ නිදහස ආරක්ෂා කිරීමට නම් බලතල බෙදීම අවශ්‍ය ම දෙයක් වන බව ය.
(5) බලතල බෙදීම හා ජනතා නිදහස එකට ගමන් නොකරන බව ය.

**12.** මානව අයිතිවාසිකම්:
(1) මානවයන් වීම නිසාම මිනිසුන්ට හිමිවන අයිතිවාසිකම් වේ.
(2) විශ්වීය, මූලික හා අසහාය වේ.
(3) අර්ථවත් වීමට නම් ගරු කිරීම අවශ්‍ය වේ.
(4) රාජ්‍යයේ පුරවැසියන්ට පමණක් භුක්ති විඳිය හැකි වේ.
(5) දුගීභාවය සහ අවවරප්‍රසාදිත තත්ත්ව යටතේ අර්ථ විරහිත වේ.

**13.** නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය:
(1) සාමාන්‍ය ජනතාව දේශපාලනයෙන් ඈත් කිරීම මගින් ආණ්ඩුවේ ස්ථාවරභාවය පවත්වා ගෙන යාමට උපකාරී වේ.
(2) ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රායෝගික ආදර්ශයක් සපයනු ලැබේ.
(3) ආණ්ඩුකරණය පිළිබඳ තීරණ ගැනීමේ වගකීමෙන් සාමාන්‍ය පුරවැසියන් මුදාහැරේ.
(4) විශේෂඥ දැනුම සහිත අය මත ආණ්ඩුකරණය පවත්වා ගෙන යාමට ඉඩ සලසා දේ.
(5) පාලක-පාලිත දුරස්ථභාවය නැති කෙරේ.

[තුන්වැනි පිටුව බලන්න.

**14.** සන්ධීය ආණ්ඩුක්‍රමය:
(1) තවත් ආකාරයක බලය බෙදීමේ ආදර්ශයක් වේ.
(2) ඒකීයත්වයේ සහ විවිධත්වයේ වාසි එක්තැන් කරන්නක් වේ.
(3) අධි මධ්‍යගත මධ්‍යම ආණ්ඩුවක් පැන නැගීමට මාර්ගය පාදනු ලැබේ.
(4) ප්‍රාදේශීය වශයෙන් ස්ථානගත වී ඇති සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට උපකාරී වේ.
(5) භූමි ප්‍රමාණයෙන් විශාල රාජ්‍යයන්ට වඩාත් සුදුසු වේ.

**15.** ඒකීය ආණ්ඩුක්‍රමය:
(1) බල විරහිත මධ්‍යම ආණ්ඩුවක් ඇතිවීම කෙරෙහි මග පාදනු ලැබේ.
(2) කුඩා රාජ්‍යයන්ට හෝ සජාතීය ලක්ෂණ සහිත පළාත්වලින් යුත් රාජ්‍යයන්ට වඩාත් සුදුසු වේ.
(3) සමස්ථ රට පුරා ඒකීය නීති ක්‍රමයක් හා පරිපාලන ක්‍රමයක් පවත්වා ගෙන යාමට උපකාරී වේ.
(4) ආණ්ඩුවේ වැඩකටයුතු දෙවරක් කිරීමෙන් සිදුවන නාස්තිය වළක්වා ගැනීමට උපකාරී වේ.
(5) ආණ්ඩුවේ වගකීම හා වගවීම පැහැදිලි ව හඳුනාගැනීමට උපකාරී වේ.

- අංක **16** සිට **35** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් සපයා ඇත. ඒවායින් නිවැරදි වන්නේ ප්‍රකාශ හතරක් පමණි. **නිවැරදි** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

**16.** කැබිනට් ආණ්ඩුක්‍රමය:
A - නාමික හා සත්‍ය යනුවෙන් විධායක දෙකකින් සමන්විත වේ.
B - සාමූහික හා පුද්ගලික වගකීම යන මූලධර්ම දෙක මත ක්‍රියාත්මක වේ.
C - සාර්ථක ක්‍රියාකාරිත්වය සඳහා දේශපාලන සජාතිකභාවය අවශ්‍ය වේ.
D - ආණ්ඩුව තුළ කැබිනට් මණ්ඩලයේ ඒකාධිපතිත්වයක් බිහිවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කෙරේ.
E - හොඳින් සංවිධානය වූ ද්විපක්ෂ ක්‍රමයක් යටතේ සාර්ථක ව ක්‍රියාත්මක වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**17.** ජනාධිපති ආණ්ඩුක්‍රමය:
A - ආණ්ඩුවේ ස්ථාවරභාවය කැබිනට් ක්‍රමයට වඩා සහතික කෙරේ.
B - දේශපාලන පක්ෂවල බලපෑම අවම කෙරේ.
C - සමාජ බහුවිධතාව සහිත රටවල්වලට වඩාත් යෝග්‍ය වේ.
D - ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණය යම් ප්‍රමාණයකින් දුර්වල කෙරේ.
E - බලතල බෙදීමේ පදනම මත ක්‍රියාත්මක වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**18.** ඇමෙරිකා එක්සත් ජනපදයේ සන්ධීය ආණ්ඩුක්‍රමය:
A - මධ්‍යම ආණ්ඩුවකින් සහ ප්‍රාන්ත රාජ්‍ය පනහකින් සමන්විත වේ.
B - බලතල බෙදීම සහ සංවරණ හා තුලන න්‍යායන් මත ගොඩනගා ඇත.
C - ස්වකැමැත්ත මත ප්‍රාන්ත රාජ්‍යයන්ට ඉවත් වීමේ අයිතිය සහිත ප්‍රාන්ත රාජ්‍ය එකතුවක් වේ.
D - දුර්වල මධ්‍යම ආණ්ඩුවක් සහ ශක්තිමත් ප්‍රාන්ත රාජ්‍ය සහිත හැඩහුරුවකින් යුක්ත වේ.
E - සම්භාව්‍ය සන්ධීයවාදය සඳහා දිය හැකි හොඳම නිදසුන ලෙස සැලකේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**19.** බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය:
A - පාර්ලිමේන්තුව නමින් හැඳින්වේ.
B - මණ්ඩල දෙකකින් සමන්විත වේ.
C - පාර්ලිමේන්තු ස්වාධිපති න්‍යාය මත ක්‍රියාත්මක වේ.
D - ව්‍යවස්ථාදායක කාර්ය සම්බන්ධයෙන් රජිනට වගකිව යුතු වේ.
E - දේශපාලන ක්‍රමය තුළ නීති සම්පාදනය කරන උත්තරීතර ආයතනය වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**20.** 1958 ඩිගෝල් ව්‍යවස්ථාව යටතේ ප්‍රංශය තුළ පිහිටුවන ලද ආණ්ඩුක්‍රමය:
A - සිව්වන සමූහාණ්ඩුව ලෙස ද සැලකේ.
B - ජනාධිපති සහ කැබිනට් මූලධර්මවලින් යුත් දෙමුහුන් ආණ්ඩුක්‍රමයක් වේ.
C - ශක්තිමත් විධායකයක් සහ දුර්වල ව්‍යවස්ථාදායකයක් යන පදනම මත ගොඩනගා ඇත.
D - අවුරුදු පහක නිල කාලයක් සඳහා ජනතාව විසින් තෝරාපත් කරන ජනාධිපතිවරයකු නායකත්වය දරනු ලැබේ.
E - 1789 න් පසුව පිහිටුවන ලද වඩාත් ම සාර්ථක ආණ්ඩුක්‍රමය ලෙස සැලකේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

[හතරවැනි පිටුව බලන්න.

**21.** ඉන්දියාවේ සන්ධීය ආණ්ඩුක්‍රමය:
A - 1950 දී ස්ථාපිත කළ ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දුන්නේ ය.
B - අර්ධ සන්ධීය ක්‍රමයක් ලෙස සැලකේ.
C - ද්විත්ව පුරවැසිභාවය මත ගොඩනගා ඇත.
D - මධ්‍යම ආණ්ඩුවකින් සහ ප්‍රාන්ත ආණ්ඩු විසිනවයකින් සමන්විත වේ.
E - බලවත් මධ්‍යම ආණ්ඩුවක් සහ දුර්වල ප්‍රාන්ත ආණ්ඩු යන පදනම මත ගොඩනගා ඇත.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**22.** ස්විට්සර්ලන්ත සන්ධීය ආණ්ඩුක්‍රමයේ සන්ධීය සභාව:
A - සමාන බලැති මණ්ඩල දෙකකින් සමන්විත වේ.
B - මණ්ඩල දෙක එකට රැස්වන විට එක්සත් සන්ධීය සභාව ලෙස හැඳින්වේ.
C - සන්ධීය ආණ්ඩු ක්‍රමයේ උත්තරීතර නීති සම්පාදනය කරන්නා වේ.
D - සන්ධීය කවුන්සිලය, චාන්සලර්වරයා සහ සන්ධීය විනිශ්චයකරුවන් පත්කිරීමේ වගකීම දරනු ලැබේ.
E - කැන්ටන් මගින් වක්‍ර ආකාරයෙන් පත් කරන නියෝජිතයින්ගෙන් සමන්විත වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**23.** අන්තර්ජාතික දේශපාලනය:
A - අන්තර්ජාතික සමාජය තුළ රාජ්‍යයන් විසින් කරන බල අරගලය වේ.
B - රාජ්‍යයන්ගේ ජාතික ආශාවන් වර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම අරමුණ වේ.
C - ඡන්දයට වඩා උණ්ඩයෙන් කෙරෙන අරගලයක් වේ.
D - මහා බලවතුන් අතර කෙරෙන්නා වූ බල අරගලය වේ.
E - 'ආණ්ඩුවක් නොමැති දේශපාලනය' ලෙස ද හැඳින්වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**24.** රාජ්‍ය ප්‍රතිපත්ති:
A - විශේෂිත ඉලක්ක සපුරා ගැනීම උදෙසා ආණ්ඩුව විසින් සැලසුම් කරන ප්‍රතිපත්ති වේ.
B - ආණ්ඩුව කිරීමට හෝ නොකිරීමට අදහස් කරන දෑ නිරූපණය කරන ප්‍රතිපත්ති වේ.
C - මැතිවරණ ජයග්‍රහණය කිරීම ඉලක්ක කොටගෙන දේශපාලන පක්ෂ ඉදිරිපත් කරන ප්‍රතිපත්ති වේ.
D - ජනතා ප්‍රශ්න විසඳීම හෝ නැතිනම් අවම කිරීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති වේ.
E - ජනතා ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා ආණ්ඩුව සැලසුම් කරන ප්‍රතිපත්ති වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**25.** සමාජ ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන හේතු කාරක වන්නේ :
A - සමාජ පන්ති අතර බලය සහ සම්පත් අසමාන අයුරින් බෙදීයාම
B - මිනිසුන්ගේ සමාජ හැසිරීම කෙරෙහි බලපාන සමාජ ආචාරධර්ම ගැන ඇති නොඑකඟතාවයන්
C - තමන්ගේ ආශාවන් ප්‍රවර්ධනය කිරීමට සමාජ පන්ති අතර පවතින අරගලය
D - සමාජ බලය හා සම්පත් පාලනය කිරීම සඳහා සමාජ පන්ති අතර පවතින තරගකාරිත්වය
E - තම මතය විරුද්ධ කණ්ඩායම් මත පතිත කිරීම සඳහා සමාජ කණ්ඩායම් විසින් සවිඥානිකවම කරන උත්සහයන්
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**26.** 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණවල මූලික අරමුණු වූයේ:
A - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ වර්ධනයට දොර විවෘත කිරීම
B - රටේ ආර්ථිකය වැවිලි ක්‍රමයෙන් ධනවාදයට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම
C - බුද්ධාගම රාජ්‍ය ආගම ලෙස ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම
D - රට එක්සත් රාජ්‍ය ක්‍රමයක් යටතට ගෙන ඒම
E - සිවිල් සේවයට ඇතුල්වීමට ලාංකිකයින්ට ඉඩ සැපයීම මගින් ආණ්ඩුවේ වියදම් කපා හැරීම.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**27.** 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණවල **අයහපත්** ප්‍රතිඵල සමහරක් වන්නේ:
A - ලංකාව එක්සත් රාජ්‍යයක් බවට පත් වීම
B - වාර්ගික නියෝජනය හඳුන්වා දීම හේතුවෙන් ජන කොටස් අතර වර්ගවාදය පැතිරීම
C - ස්වයංපෝෂිත ග්‍රාමීය ආර්ථිකය විනාශ වීම
D - වාණිජ වතු වගාව හඳුන්වා දීම හේතුවෙන් උඩරට ප්‍රදේශවල ඇති වූ ඉඩම් ප්‍රශ්නය
E - වාණිජ වතු වගාව සඳහා ඉන්දීය ශ්‍රමය ආයාත කිරීම හේතුවෙන් පැන නැඟුණු ඉන්දියානු ද්‍රවිඩ ප්‍රශ්නය
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**28.** 1911 - 1924 කාලය තුළ ක්‍රියාවට නැංවූ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ හේතුවෙන් ලංකාවේ ආණ්ඩුකරණය හා සම්බන්ධ ව ඇති වූ වැදගත් වෙනස්වීම් කිහිපයක් වන්නේ:

A - ආණ්ඩුකාරවරයාගේ තත්ත්වය නාමමාත්‍ර විධායක මට්ටමට පහත දැමීම
B - මුදල් කාරක සභාව පිහිටුවීම
C - වැඩි කරන ලද බලය සමග ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් මන්ත්‍රී සංඛ්‍යාව වැඩි කිරීම
D - සීමිත ඡන්ද බලය හඳුන්වා දීම
E - මැතිවරණ දේශපාලනය මගින් ආණ්ඩුකරණයට ජනතාව සහභාගී වීම ආරම්භ වීම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**29.** බ්‍රිතාන්‍ය පාලනය යටතේ ලංකාව තුළ ඇති වූ වැදගත් දේශපාලන, ආර්ථික හා සමාජීය වර්ධන කිහිපයක් වන්නේ:

A - දේශීය ධනපති පංතිය බිහිවීම
B - වාමාංශික ව්‍යාපාරයේ වර්ධනය
C - දේශපාලනය කෙරෙහි උගත් මධ්‍යම පන්තියේ බලපෑම ඉහළ යාම
D - වැඩවසම් රදළයින්ගේ බලය සහ තත්ත්වය අනුක්‍රමයෙන් පහත වැටීම
E - යටත්විජිත ආණ්ඩුවේ සහාය සහිත ව පිරිවෙන් අධ්‍යාපනය යළි නැගී ඒම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**30.** ලංකාවේ ජාතික ව්‍යාපාරය:

A - පුළුල් ජනතා ව්‍යාපාරයක් විය.
B - ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක් විය.
C - ඉන්දියානු ජාතික ව්‍යාපාරය මෙන් බලවත් එකක් නොවී ය.
D - බටහිරකරණය වූ සමාජ ප්‍රභූන් විසින් මෙහෙය වූ ව්‍යාපාරයක් විය.
E - ලාංකිකයින්ට වඩාත් වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයක් ලබා ගැනීම උදෙසා මෙහෙය වූ ව්‍යාපාරයක් විය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**31.** 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:

A - විධායක කාර්යයන් කිරීම සඳහා ආණ්ඩුකාරවරයා, අමාත්‍ය මණ්ඩලය සහ විධායක කාරකසභා සහිත යාන්ත්‍රණය හඳුන්වා දුන්නේ ය.
B - ආණ්ඩුකාරවරයාගේ තත්ත්වය නාමික විධායක මට්ටමට පහත දැමී ය.
C - අමාත්‍ය මණ්ඩලය වාර්ෂික අයවැය සම්බන්ධයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට වගකීමට යටත් කළේ ය.
D - ඇතැම් කොන්දේසිවලට යටත්ව අවුරුදු 21ට වැඩි සියලු දෙනාට ඡන්ද බලය ප්‍රදානය කළේ ය.
E - ව්‍යවස්ථාදායක හා විධායක කාර්යයන් දෙක ම පැවරුණු රාජ්‍ය මන්ත්‍රණ සභාව නමින් හැඳින්වූ නියෝජන සභාවක් පිහිටුවීය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**32.** 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ රාජ්‍ය නිලධාරීන් තිදෙනා:

A - නිල බලයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සහ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකත්වය හිමි වූ යටත්විජිත ආණ්ඩුවේ නියෝජිතයින් විය.
B - රාජ්‍ය මන්ත්‍රණ සභාවට සාමූහික ව වගකීමට යටත් කළේ ය.
C - ලාංකික අමාත්‍යවරුන්ට උපදෙස් දෙන්නන් ලෙස ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කළේ ය.
D - ආණ්ඩුකාරවරයා සමග එක්ව වෙනම විධායක මණ්ඩලයක් ලෙස ක්‍රියා කරන ආකාරය දැකිය හැකි විය.
E - ව්‍යවස්ථාවේ 'මුර බල්ලන්' ලෙස හඳුනාගනු ලැබී ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**33.** 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:

A - බ්‍රිතාන්‍ය පාලකයින් විසින් නිදහස සමග ප්‍රදානය කළ නිදහස් ලංකාවේ ප්‍රථම ව්‍යවස්ථාව විය.
B - සමාන බලැති මණ්ඩල දෙකක් සහිත ව්‍යවස්ථාදායක සභාවක් සැපයුවේ ය.
C - 1944 ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල කෙටුම්පත මත මූලික වශයෙන් පදනම් විය.
D - සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළේ ය.
E - 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ස්ථාපිත කිරීමත් සමග අහෝසි විය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**34.** 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:

A - බ්‍රිතාන්‍ය වෙස්ට්මින්ස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතියට සමාන ආණ්ඩුක්‍රමයක් ප්‍රදානය කළේ ය.
B - සත්‍ය විධායකය නමින් හැඳින්වුණු කැබිනට් මණ්ඩලයට විධායක බලතල පැවරී ය.
C - සීමිත ව්‍යවස්ථාදායක බලයක් සහිත පාර්ලිමේන්තුව නමින් හැඳින්වුණු ව්‍යවස්ථාදායක සභාවක් පිහිටුවීය.
D - සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විශේෂ ආරක්ෂණ විධිවිධාන සැපයුවේ ය.
E - අගමැතිවරයා විසින් පත්කළ නාමික විධායක තනතුරක් හඳුන්වා දුන්නේ ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**35.** 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:

A - මහා බ්‍රිතාන්‍ය සමග පැවති සියලු ව්‍යවස්ථා සම්බන්ධතා අත්හැරීමේ සන්ධිස්ථානය සනිටුහන් කළේ ය.
B - ලංකාවේ නිල නාමය 'ශ්‍රී ලංකාව' ලෙස වෙනස් කළේ ය.
C - සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ කැබිනට් ක්‍රමය තවදුරටත් පවත්වාගෙන ගියේ ය.
D - රට තුළ ජීවත් වූ සියලු ම ඉන්දියානු ද්‍රවිඩයින්ට පුරවැසිකම ප්‍රදානය කළේ ය.
E - අධිකරණ සේවය හා සිවිල් සේවය දේශපාලන විධායකය යටතට පත් කළේ ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

- අංක **36** සිට **40** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් සපයා ඇත. ඒවායින් ප්‍රකාශ **හතරක්** සාවද්‍ය වේ. **සාවද්‍ය** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

**36.** 1972 ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ජාතික රාජ්‍ය සභාව:

A - සෝල්බරි ව්‍යවස්ථාව යටතේ තිබූ ව්‍යවස්ථාදායකයට සමාන විය.
B - ඡන්දයෙන් හා නාමකරණයෙන් තේරී පත් වූ මන්ත්‍රීවරු දෙවර්ගයෙන් ම සමන්විත විය.
C - පාර්ලිමේන්තු ස්වාධිපති න්‍යාය මත ස්ථාපිත කළ ආයතනයක් විය.
D - යටත් පිරිසෙයින් මාසයකට වරක්වත් සැසිවාර පැවැත්විය යුතු විය.
E - ජනාධිපති නමින් හැඳින් වූ නාමමාත්‍ර විධායකය මුලසුන දැරී ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**37.** 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ ආණ්ඩුක්‍රමය:

A - ජනාධිපති ආණ්ඩුක්‍රමයට ආවරණය වූ රාජාණ්ඩු පාලන ක්‍රමයක් ය.
B - ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තෝරා ගන්නා ජනාධිපතිවරයකුගෙන් ආවරණය වූ ඒකාධිපති ක්‍රමයක් ය.
C - ප්‍රංශ ජනාධිපති ක්‍රමයට සමාන ව යන දෙමුහුන් විධායක ක්‍රමයක් ය.
D - ඇමෙරිකානු ජනාධිපති ක්‍රමයට සමාන ජනාධිපති ක්‍රමයක් ය.
E - ජනාධිපතිවරයකු විසින් විධායකයේ නායකත්වය දරන පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**38.** 1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පාර්ලිමේන්තුව:

A - පාර්ලිමේන්තු ස්වාධිපති මූලධර්මය මත ගොඩනගා ඇත.
B - සමන්විත වන්නේ ජනතාව විසින් තෝරා පත්කරන නියෝජිතයින්ගෙන් පමණි.
C - වසර පහක නිල කාලයක් සඳහා තේරී පත්වන ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකයක් වේ.
D - අගමැතිවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයාට විසුරුවා හැරිය හැක.
E - නීති සම්පාදනය සම්බන්ධයෙන් පූර්ණ ව්‍යවස්ථාදායක බලයක් හිමි කරගෙන නැත.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**39.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය යටතේ පිහිටුවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාර්ය වන්නේ:

A - උසස් රාජ්‍ය නිලධාරීන් පත්කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිට හා කැබිනට් මණ්ඩලයට සහාය වීම
B - යහපාලන ආණ්ඩුකරණය හා සම්බන්ධ කරුණු පිළිබඳ ව කටයුතු කිරීමට ජනාධිපතිට සහාය වීම
C - සමහර ස්වාධීන කොමිෂන් සභාවලට පත්කිරීම් කිරීම සඳහා ජනාධිපතිට නිර්දේශ සැපයීම
D - රාජ්‍ය සේවකයින්ගේ වංචා සහ දූෂණ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ජනාධිපතිට සහාය වීම
E - අමාත්‍යාංශ ලේකම්වරුන් පත්කිරීම සඳහා ජනාධිපතිට සහාය වීම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**40.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත මූලික අයිතිවාසිකම්:

A - මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් අයිතිවාසිකම්වලට කිසිසේත් ම සමාන නැත.
B - භුක්ති විඳිය හැක්කේ පුරවැසියන්ට පමණි.
C - අධිකරණ විනිශ්චයකට යොමු කළ හැක්කේ උල්ලංඝනය වීම විධායක ක්‍රියාවක් මගින් සිදු වුවහොත් පමණි.
D - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රකාශිත මහජන ස්වාධිපතිත්වයේ නොබිඳිය හැකි කොටසක් වේ.
E - රාජ්‍ය සහ අධිකරණය අතර ගැටුම් ඇතිවීම කෙරෙහි බලපා ඇති ප්‍රධාන මූලාශ්‍රය ලෙස සැලකේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

[හත්වැනි පිටුව බලන්න.

- අංක **41** සිට **50** දක්වා ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් ඉදිරිපත් කර ඇත. ඒවායින් නිවැරදි වන්නේ **හතරක්** පමණි. **නිවැරදි** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

**41.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 19 වන සංශෝධනය යටතේ:
A - ජනාධිපතිගේ ධූර කාලය වසර 6 සිට 5 දක්වා අඩු කළේ ය.
B - ජනාධිපති ධූර අපේක්ෂකයින්ගේ අවම වයස් සීමාව අවුරුදු 30 සිට 35 දක්වා වැඩි කළේ ය.
C - එක් පුද්ගලයකුට ජනාධිපති ධූරය දැරිය හැක්කේ දෙවතාවක් පමණි යන කොන්දේසිය නැවත පැනවී ය.
D - පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන පනත් කෙටුම්පත් ජනමත විචාරණයට තැබීමේ ජනාධිපති සතු බලය වෙනස් නොකළේ ය.
E - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගරු කරමින් එය පිළිපදින බවට සහතික වීම ජනාධිපතිවරයාගේ වගකීමක් බවට පත් කළේ ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**42.** ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ:
A - ප්‍රධාන පක්ෂ දෙකකින් හා කුඩා පක්ෂ රාශියකින් යුත් බහු පක්ෂ ක්‍රමයක පැවැත්ම
B - ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක විසින් පක්ෂ ක්‍රමය අභිභවනය කිරීම
C - ප්‍රධාන පක්ෂ දෙක වටා එක්රැස් වූ කුඩා පක්ෂ පදනම් කරගෙන ගොඩනැගුන ද්විසභාග පක්ෂ ක්‍රමය
D - වාර්ගික පදනම මත පක්ෂ පිහිටුවීමේ ප්‍රවණතාව ඉහළ යාම
E - දේශපාලන පක්ෂ ක්‍රමයේ තුන්වන බලවේගය ලෙස පැරණි වම යළි හිස එසවීම
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**43.** 1978 ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දුන් සමානුපාතික නියෝජන ක්‍රමය:
A - බහු මන්ත්‍රී දිස්ත්‍රික්ක කොට්ඨාශ ක්‍රමය පදනම් කරගෙන ක්‍රියාත්මක වේ.
B - මැතිවරණයක දී එක් ඡන්දදායකයකුට මනාප තුනක් ප්‍රකාශ කිරීමේ අවස්ථාව හිමි වේ.
C - ද්විපක්ෂ ක්‍රමයක් වර්ධනය වීම කෙරෙහි අනුබලය සැපයේ.
D - පක්ෂ නායකත්වයේ කතිපයාධිකාරී බලය වර්ධනය වීම කෙරෙහි දායකත්වය සැපයේ.
E - පාර්ලිමේන්තුව තුළ 2/3 බහුතරයක් හිමිකර ගැනීමට කිසිදු පක්ෂයකට පහසුකම් නොසැපයේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**44.** ශ්‍රී ලංකාවේ පළාත් සභා:
A - පිහිටුවා තිබෙන්නේ රටේ මූලික නීතියෙනි.
B - හඳුන්වා දුන්නේ රටේ වාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් ලෙස ය.
C - ප්‍රඥප්ති සෑදීමේ බලය භුක්ති විඳී.
D - පිහිටුවා ඇත්තේ දිස්ත්‍රික්කයකට එකක් වන පරිදි ය.
E - පිහිටුයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වන සංශෝධනය මගිනි.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**45.** එක්සත් ජාතීන්ගේ සංවිධානය:
A - වර්තමාන ලෝකය තුළ පවතින විශාල ම අන්තර් රාජ්‍ය සංවිධානය වේ.
B - මහ බලවතුන් පස්දෙනාගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් පාලනය කෙරේ.
C - ප්‍රධාන ආයතන හයකින් සමන්විත වේ.
D - ලෝක සාමය හා සුරක්ෂිතතාව පවත්වා ගෙනයාමේ වගකීම දරන ප්‍රධාන අන්තර්ජාතික රාජ්‍ය සංවිධානය වේ.
E - ක්‍රියා කරන්නේ සාමාජික රාජ්‍යයන්ගේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවීමේ ප්‍රතිපත්තිය මත ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**46.** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලය:
A - 2006 වර්ෂයේ මහා මණ්ඩලය විසින් පිහිටුවන ලදී.
B - සමන්විත වන්නේ මහා මණ්ඩලය විසින් පත් කරන සාමාජිකයින් 47 දෙනෙකුගෙනි.
C - සෑම ආකාරයක ම මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ වගකීම පැවරී ඇත.
D - මානව හිමිකම් පිළිබඳ විෂයානුබද්ධ ප්‍රශ්න හා තත්ත්වයන් අවුරුද්ද පුරාම සාකච්ඡා කිරීමේ බලය සහිත වේ.
E - තම කාර්ය සම්බන්ධයෙන් මහලේකම්වරයාට වගකීමට බැඳී සිටී.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**47.** කලාපීය සහයෝගිතාව සඳහා වූ දකුණු ආසියාතික සංවිධානය:
A - රාජ්‍ය නොවන සංවිධානයක් වේ.
B - දකුණු ආසියාතික රාජ්‍යයන් අටකින් සමන්විත වේ.
C - කලාපීය ආර්ථික හා සමාජීය සහයෝගිතාව වර්ධනය කිරීම ගැන සැලකිලිමත් වේ.
D - පිහිටුවා තිබෙන්නේ 1985 ඪකා ප්‍රකාශනයේ අන්තර්ගත මූලධර්ම පදනම් කරගෙන ය.
E - අන්තර්ජාතික සමාජයේ ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ 'දුප්පතුන්ගේ සමාජය' ලෙස ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

[අවවැනි පිටුව බලන්න.

**48.** පොදු රාජ්‍ය මණ්ඩලය:
A - ව්‍යවස්ථාවක් පදනම් කරගෙන පිහිටුවා නැති එකම රාජ්‍ය සංවිධානය වේ.
B - වර්තමානයේ සමන්විත වන්නේ සාමාජිකයින් 53 දෙනෙකුගෙනි.
C - මහලේකම්වරයාගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වේ.
D - ක්‍රියාත්මක වන්නේ සාමාජික රාජ්‍යයන්ගේ අන්තර් ආණ්ඩු එකඟතා මත ය.
E - සමන්විත වන්නේ සර්වාධිපති රාජ්‍යයන්ගෙන් වන අතර ඒවායින් බහුතරය පැරණි බ්‍රිතාන්‍ය යටත්විජිත වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**49.** අන්තර්ජාතික ක්ෂමා ආයතනය:
A - 1961 වර්ෂයේ දී පිහිටි රාජ්‍ය නොවන සංවිධානයක් වේ.
B - 'ලෝකයේ සියලු දෙනාට ම මානව අයිතීන්' යන තේමාව ප්‍රචාරණය කිරීමේ යෙදී සිටින ව්‍යාපාරයක් වේ.
C - යුධ සිරකරුවන්ගේ සුභසාධනය ගැන අවධානය දක්වන අන්තර් රාජ්‍ය සංවිධානයක් වේ.
D - ජාත්‍යන්තර සමාජය තුළ පොදුවේ හඳුන්වන්නේ 'AMNESTY' හෝ 'AI' ලෙස ය.
E - නීති උපදෙස්, මාධ්‍ය අවධානය, මානව හිමිකම් පිළිබඳ ව ප්‍රචාරණය හා පර්යේෂණ පැවැත්වීම යන ක්ෂේත්‍ර හා සම්බන්ධ ව ක්‍රියාත්මක වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**50.** අන්තර්ජාතික රතු කුරුස කමිටුව:
A - ස්විට්සර්ලන්තයේ ජිනීවා නගරය මූලස්ථානය කරගෙන ක්‍රියාත්මක වන මානව දයාවාදී සංවිධානයක් වේ.
B - අන්තර්ජාතික මානව හිතවාදී නීතිය වර්ධනය කිරීම හා බැඳී සිටින ප්‍රධාන අන්තර්ජාතික සංවිධානය වේ.
C - ක්‍රියාත්මක වන්නේ මානව හිතවාදය, අපක්ෂපාතීභාවය, ස්වාධීනත්වය, ස්වේච්ඡාත්මකභාවය, විශ්වීයභාවය යන මූලධර්ම පදනම් කරගෙන ය.
D - ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වන්නේ සන්නද්ධ ගැටුම්වල දී පීඩාවට පත්වන අයට සහන සැලසීම ගැන ය.
E - එක්සත් ජාතීන්ගේ පවුලේ අනුබද්ධිත ආයතනයක් වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | | |
|---|---|---|---|
| දේශපාලන විද්‍යාව II<br>அரசியல் விஞ்ஞானம் II<br>Political Science II | 23 S II | | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

විභාග අංකය: ..................................

| | |
|---|---|
| A කොටස | |
| මුළු ලකුණු | 20 |

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය **A, B** හා **C** වශයෙන් කොටස් **තුනකින්** යුක්ත ය.

※ **A** කොටස තුළ කෙටි ප්‍රශ්න **20** ක් අන්තර්ගත වේ. සම්පූර්ණ පිළිතුරක් සඳහා ලකුණු **01** ක් ද, අර්ධ පිළිතුරක් සඳහා ලකුණු **1/2** ක් ද හිමි වේ. මෙම කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා **B** හා **C** කොටස්වල පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

※ **B** හා **C** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## A කොටස

**1.** පහත දැක්වෙන ප්‍රකාශ දෙකෙන් පැහැදිලි කරන්නේ දේශපාලන ක්‍රම දෙකක රාජ්‍යය සහ පුරවැසියන් අතර පවතින සම්බන්ධතාව පාලනය වන ආකාරයයි. එම ක්‍රම **දෙක** හඳුනාගෙන පිළිවෙළින් නම් කරන්න.

(i) "මෙම දේශපාලන ක්‍රමය තුළ ආණ්ඩුවේ තනතුරුවලට පත්වීම සඳහා තරගකාරිත්වයක් පවතී. තේරීම කරන්නේ බලය යෙදවීමෙන් තොර, එමෙන් ම කිසිදු සමාජ කණ්ඩායමක් පිටමං නොකළ, කාලීන ව පවත්වන සාධාරණ මැතිවරණ මගිනි. තම නායකයින් තේරීමට මෙන් ම රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට ද පුරවැසියන්ට සහභාගි විය හැක. දේශපාලන ක්‍රමය මගින් සහතික කර ඇති සිවිල් හා දේශපාලන නිදහස යටතේ තරගකාරීභාවයේ සහ සහභාගිවීමේ ඒකාග්‍රතාව ආරක්ෂා කෙරේ."

(ii) "මෙම දේශපාලන ක්‍රමය තුළ පුරවැසි ජීවිතයේ පෞද්ගලික වුව ද, පොදු වුව ද, සෑම අංශයක් ම පාලනය කිරීමට හා මෙහෙයවීමට රාජ්‍යය මැදිහත් වේ. එයින් අදහස් වන්නේ රාජ්‍යය මගින් තීරණය කරන ලද සමහර අරමුණු සපුරා ගැනීම ඉලක්ක කොටගෙන ජනතාවගේ දේශපාලන, ආර්ථික, සමාජීය-සංස්කෘතික සහ බුද්ධිමය ජීවිතය රාජ්‍යය මගින් මෙහෙයවීම ය. රාජ්‍යයට විරුද්ධ වීමට හෝ එය විවේචනය කිරීමට හෝ නව අරමුණක් ඉදිරිපත් කිරීමට හෝ පුරවැසියන්ට අයිතිය නොමැත."

(1) ..........................................................................................

(2) ..........................................................................................

**2.** පහත දැක්වෙන ප්‍රකාශ දෙකෙන් පෙන්නුම් කරන දේශපාලන සංවිධාන **දෙක** පිළිවෙළින් නම් කරන්න.

(i) "මෙම දේශපාලන සංවිධානය සමන්විත වන්නේ දේශසීමාව තුළ වාසය කරන සියලු ම පුරවැසියන්ගෙනි."

(ii) "මෙම දේශපාලන සංවිධානය සමන්විත වන්නේ දේශසීමාව තුළ වාසය කරන පුරවැසියන් කොටසකගෙන් පමණි."

(1) ..........................................................................................

(2) ..........................................................................................

**3.** පහත දැක්වෙන ප්‍රකාශ දෙකෙන් පෙන්නුම් කරන සමාජ සංවිධාන **දෙක** පිළිවෙළින් නම් කරන්න.

(i) "එය දේශසීමා සහිත සංවිධානයක් වේ. එය නිශ්චිත දේශසීමාවන්ගෙන් යුක්ත වූවක් වේ."

(ii) "එය විශ්වීය වේ. එයට දේශසීමාවක් නොමැත."

(1) ..........................................................................................

(2) ..........................................................................................

[දෙවැනි පිටුව බලන්න.

**4.** පහත දැක්වෙන පළමු ප්‍රකාශය මගින් විස්තර කෙරෙන සමාජ සංවිධානය සහ දෙවන ප්‍රකාශය මගින් විස්තර කෙරෙන දේශපාලන සංවිධානය පිළිවෙළින් නම් කරන්න.

(i) "එය ගොඩනැගී තිබෙන්නේ පොදු වාර්ගිකත්වයකින්, පොදු ආගමකින්, පොදු වාසස්ථානයකින්, පොදු භාෂාවකින්, පොදු ඓතිහාසික සම්ප්‍රදායන්ගෙන්, පොදු ආශාවන්ගෙන්, පොදු පාලනයකින් සහ භූගෝලීය එක්සත්භාවයෙනි."

(ii) "එය භූමිය, ජනගහනය, ආණ්ඩුව සහ ස්වාධිපතිත්වය යන අත්‍යවශ්‍ය සාධක හතරෙන් සමන්විත වේ. එම සාධක හතර පවතින විට එහි පැවැත්ම සිදු වේ."

(1) ................................................................................................................................

(2) ................................................................................................................................

**5.** පහත දැක්වෙන ප්‍රකාශ දෙකෙන් අවධාරණය කරන දේශපාලන දාර්ශනිකයින් **දෙදෙනා** පිළිවෙළින් නම් කරන්න.

(i) "දේශපාලන හා සමාජ චින්තන ඉතිහාසයේ ප්‍රථම විඥානවාදී දේශපාලන දාර්ශනිකයා"

(ii) "දේශපාලන හා සමාජ චින්තන ඉතිහාසයේ ප්‍රථම යථාර්ථවාදී දේශපාලන දාර්ශනිකයා"

(1) ................................................................................................................................

(2) ................................................................................................................................

**6.** පහත දැක්වෙන ප්‍රකාශ දෙකෙන් විස්තර කරන්නේ අන්තර් සම්බන්ධතාවන් සහිත විෂය **දෙකක** විෂය කරුණු වේ. ඒවා හඳුනාගෙන පිළිවෙළින් නම් කරන්න.

(i) "එය දේශපාලන විද්‍යාවේ විෂයීගත කරුණක් වේ. එය සම්පාදනය කරන්නේ සහ බලාත්මක කරන්නේ රාජ්‍ය විසිනි. එය කඩකිරීම වරදක් වන අතර දඬුවමට යටත් විය හැක. එය විශ්වීය වන අතර සියලු ම දෙනා කෙරෙහි යෙදවේ. එය පැහැදිලි මෙන් ම නිශ්චිත වේ. එය සැලකිලිමත් වන්නේ මිනිසාගේ බාහිර ක්‍රියාවන් ගැන පමණි."

(ii) "එය සදාචාර විද්‍යාවේ විෂයීගත කරුණක් වේ. එය ක්‍රියාවට නැංවෙන්නේ මිනිසුන්ගේ හෘදය සාක්ෂිය මගින් වන නිසා එය තීරණය වන්නේ ද මිනිසුන්ගේ හෘදය සාක්ෂිය මගිනි. එමගින් මිනිසුන්ගේ සිතුම් පැතුම් මෙන් ම ක්‍රියාවන් ද අන්තර්ගත සමස්ත ජීවිතය ම නිරූපණය වේ. එමගින් ජීවිතයේ අභ්‍යන්තර මෙන් ම බාහිර ක්‍රියාවන් ද නිරූපණය වේ. එය කඩකිරීම නීතිමය වරදක් නොවන බැවින් භෞතික දඬුවමකට යටත් වීමක් ද සිදු නොවේ."

(1) ................................................................................................................................

(2) ................................................................................................................................

**7.** පහත දැක්වෙන අර්ථකථන දෙකෙන් නිරූපණය වන ආණ්ඩුක්‍රම **දෙක** පිළිවෙළින් දක්වන්න.

(i) "එය පාලන ක්‍රමයක් ලෙස අර්ථකථනය කර ඇති අතර, එම ක්‍රමය තුළ රාජ්‍යයේ කැමැත්ත ජනතාවගේ සෘජු සහභාගිත්වය හරහා ප්‍රකාශ වේ."

(ii) "එය ආණ්ඩුක්‍රමයක් වන අතර, එය පැන නගින්නේ නීතිමය සර්වාධිපති වන ඡන්දදායකයින් සෘජුව ම ආණ්ඩුක්‍රම යාන්ත්‍රණයේ නායකත්වය ගෙන ක්‍රියා කරනවා වෙනුවට තමන් නියෝජනය කරමින් තමන් වෙනුවෙන් ක්‍රියා කිරීමට ධාරිතාව සහිත ආණ්ඩුකරණ ආයතනයක් හෝ ආයතන පිහිටුවීම සමග ය."

(1) ................................................................................................................................

(2) ................................................................................................................................

**8.** පහතින් දක්වා ඇත්තේ ආණ්ඩුවේ කාර්ය ක්‍රියාවට නැංවීම සහ රාජ්‍ය බලයේ ස්වභාවය පිළිබඳ ව දේශපාලන න්‍යායන් දෙකක් මගින් ඉදිරිපත් කර ඇති අර්ථකථනයන් ය. එම න්‍යාය **දෙක** හඳුනාගෙන ඒවා පිළිවෙළින් නම් කරන්න.

(i) "මෙම න්‍යායය මගින් දැක්වෙන්නේ ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන ආණ්ඩුවේ කාර්යයන් තුන එකිනෙකට වෙනස් පුද්ගලයින්ගෙන් සමන්විත ආයතන තුනක් මගින් ක්‍රියාවට නැංවිය යුතු බවත්, ඒ ඒ ආයතනයට පැවරී ඇති විෂය පථයට පමණක් ඒ ඒ ආයතනයේ කාර්ය සීමාවිය යුතු බවත්, ඒ ඒ ආයතනය තම විෂය ක්ෂේත්‍රය තුළ නිදහස් හා උත්තරීතර විය යුතු බවත් ය."

(ii) "එය නීතියෙන් සීමා නොවුන පුරවැසියන් හා යටත්වැසියන් කෙරෙහි යෙදවිය හැකි රාජ්‍යයේ උත්තරීතර බලය වේ. එය ඒකීය, අසහාය, උත්තරීතර, බෙදිය නොහැකි, පැවරිය නොහැකි සහ ස්ථාවර දෙයක් වේ. එය අවසාන අධිකාරී බලය වන අතර අභ්‍යන්තර හා බාහිර වශයෙන් දෙයාකාර වේ.

(1) ................................................................................................................................

(2) ................................................................................................................................

[තුන්වැනි පිටුව බලන්න.

**9.** පහතින් දක්වා ඇත්තේ එකිනෙකට වෙනස් ආණ්ඩුක්‍රම දෙකක විධායක-ව්‍යවස්ථාදායක සම්බන්ධතාවන්හි ස්වරූපයයි. එම ආණ්ඩුක්‍රම **දෙක** හඳුනාගෙන ඒවා පිළිවෙලින් නම් කරන්න.

(i) "විධායකය හා ව්‍යවස්ථාදායකය වෙන් වෙන් ව තෝරා පත් කරන අතර, ඒවාට ව්‍යවස්ථාව මගින් ම ස්වාධීන කාර්ය ක්ෂේත්‍රයක් පවරා ඇත. විධායක හා ව්‍යවස්ථාදායක අංශයන්හි පුද්ගලයින් නිල වශයෙන් වෙන් කර ඇත. විධායකය ව්‍යවස්ථානුකූලව ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නැති අතර අති විශේෂ ක්‍රියාදාමයක් වූ දෝෂාභියෝගයකින් තොරව විධායකය තනතුරින් ඉවත් කළ නොහැක."

(ii) "විධායකය නාමික හා සත්‍ය යනුවෙන් කොටස් දෙකකින් යුක්ත වන අතර සත්‍ය විධායකය සමන්විත වන්නේ ව්‍යවස්ථාදායකය නියෝජනය කරන දේශපාලන පක්ෂවල ශක්තිය මත ඒවායින් තෝරාගත් පුද්ගලයින්ගෙනි. එබැවින් වෙන ම තේරීපත් වූ විධායකයක් නොමැත. සත්‍ය විධායකය, ව්‍යවස්ථාදායකයෙන් තෝරාපත් කර ගැනීම හේතුවෙන් එය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී සිටී. මේ අනුව විධායකය-ව්‍යවස්ථාදායකයේ විශ්වාසය මත රඳා පවතින අතර එම විශ්වාසය නැති වී ගිය විට විධායකය නිලයෙන් ඉවත් කළ හැක."

(1) ..............................

(2) ..............................

**10.** පහතින් දක්වා ඇත්තේ ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවීම සඳහා භාවිතයට ගැනෙන විධික්‍රම **දෙකකි**. ඒවා පිළිවෙළින් නම් කරන්න.

(i) "පනත් කෙටුම්පත් නීති ලෙස බලාත්මක කිරීමට ප්‍රථමයෙන් ජනතාවගේ තීන්දුව ලබා ගැනීම සඳහා භාවිතයට ගැනෙන ජනතා මතය විමසීමේ උපකරණයක් වේ. ඒ අනුව ව්‍යවස්ථාදායකය සම්මත කරන පනත්, නීති බවට පත්වන්නේ ඡන්දදායකයින්ගෙන් බහුතරය අනුමත කරන්නේ නම් පමණි."

(ii) "තේරී පත්වුන නියෝජිතයකු තමන්ට දී ඇති ජනවරම කඩකළ විටක එම නියෝජිතයා තනතුරින් ඉවත් කිරීමට යොදා ගැනෙන තවත් උපකරණයක් වේ. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පෙත්සමක් සඳහා ඡන්ද කොට්ඨාශයේ ඡන්දදායකයින්ගෙන් බහුතරය අනුමත කරන්නේ නම් නියෝජිතයා තනතුරින් ඉවත් කළ හැක."

(1) ..............................

(2) ..............................

**11.** (i) ලංකාව එක්සත් රාජ්‍යයක් බවට පත් කළේ කුමන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය මගින් ද?

(ii) ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් ලෙස ප්‍රථමවරට ප්‍රකාශයට පත් කළේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද?

(1) ..............................

(2) ..............................

**12.** (i) නිදහසට පෙර ලංකාවට බ්‍රිතාන්‍ය යටත්විජිත පාලකයින් විසින් හඳුන්වා දුන් අවසාන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය කුමක් ද?

(ii) එම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය මගින් ලංකාවට හඳුන්වා දුන් ආණ්ඩුක්‍රමය කුමක් ද?

(1) ..............................

(2) ..............................

**13.** (i) සෝල්බරි ව්‍යවස්ථාව යටතේ සෙනෙට් මණ්ඩලයට වෙන් කළ යුතු යැයි සැලකුණු අවම අමාත්‍ය ධූර සංඛ්‍යාව කොපමණ ද?

(ii) සෝල්බරි ව්‍යවස්ථාවෙන් සෙනෙට් මණ්ඩලයට දිය යුතු යැයි නියම කළ අනිවාර්ය ඇමති ධූරය කුමක් ද?

(1) ..............................

(2) ..............................

**14.** නාමික විධායක තනතුර පවත්වාගෙන ගිය නිදහස් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා **දෙක** නම් කරන්න.

(1) ..............................

(2) ..............................

**15.** (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ ව ක්‍රියා කිරීම සඳහා පූර්ව අධිකරණ විවරණ බලය සහිත වෙනම අධිකරණයක් ස්ථාපිත කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම් කරන්න.

(ii) පූර්ව අධිකරණ විවරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**16.** 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ:

(i) ජනාධිපතිගේ නිල කාලය සහ

(ii) එක් පුද්ගලයකුට එම නිලය දැරිය හැකි වාර ගණන සම්බන්ධයෙන් ඇති කළ වෙනස්කම් මොනවා ද?

(1) ....................................................................................................

(2) ....................................................................................................

**17.** (i) 19 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව පාර්ලිමේන්තුවේ නිල කාලය පිළිබඳව ඇති කළ වෙනස කුමක් ද?

(ii) පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සම්බන්ධයෙන් 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් දැමූ සීමාව කුමක් ද?

(1) ....................................................................................................

(2) ....................................................................................................

**18.** (i) 1978 ව්‍යවස්ථාව මගින් මූලික අයිතිවාසිකම් කඩකිරීම පිළිබඳ කරුණු විනිශ්චය කිරීම සඳහා අධිකරණ බලය පවරා ඇති අධිකරණය කුමක් ද?

(ii) 1978 ව්‍යවස්ථාව මගින් රිට් ආඥා නිකුත් කිරීමේ අධිකරණ බලය පවරා ඇති අධිකරණය කුමක් ද?

(1) ....................................................................................................

(2) ....................................................................................................

**19.** (i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන ආයතන ගණන සඳහන් කරන්න.

(ii) සියලු ම ආකාර මානව හිමිකම් හා සම්බන්ධ කරුණු පිළිබඳව ක්‍රියා කරන, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතනය නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**20.** (i) කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියාතික සංවිධානයේ (SAARC) සාමාජිකත්වය ලබාගත් අවසාන රාජ්‍යය නම් කරන්න.

(ii) කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියාතික සංවිධානයේ තීරණ ගැනීමේ ඉහළ ම ආයතනය නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2016**

**දේශපාලන විද්‍යාව II**
அரசியல் விஞ்ஞானம் II
Political Science II

**23 S II**

**උපදෙස්:**
※ **B** හා **C** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## B කොටස

1. දේශපාලන විද්‍යාව, ස්වභාවික විද්‍යාවකට වඩා සමාජ විද්‍යාවක් ලෙස සැලකේ. ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 20 යි.)

2. පහත දැක්වෙන **දෙකක්** ගැන අදහස් දක්වන්න.
   (i) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කාර්යභාරය
   (ii) නූතන ආණ්ඩුක්‍රම තුළ විධායකයේ කාර්යභාරය
   (iii) නූතන ආණ්ඩුක්‍රම තුළ ව්‍යවස්ථාදායකයේ කාර්යභාරය
   (iv) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය තුළ අධිකරණයේ කාර්යභාරය (ලකුණු $10 \times 2 = 20$ යි.)

3. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය තුළ පහත දැක්වෙන ඒවායින් **දෙකක** කාර්යභාරය විමසන්න.
   (i) සිවිල් සමාජය
   (ii) යහපාලනය
   (iii) ජනමාධ්‍ය
   (iv) දේශපාලන පක්ෂ (ලකුණු $10 \times 2 = 20$ යි.)

4. පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** පිළිබඳ ව සාකච්ඡා කරන්න.
   (i) ඇමෙරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රමය තුළ විධායක බලය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් පවතින සංවරණ
   (ii) ඉන්දියාවේ **හෝ** මහා බ්‍රිතාන්‍යයේ දේශපාලන විධායකය පත්කිරීම සහ තනතුරින් ඉවත් කිරීම හා සම්බන්ධ ක්‍රියාදාමය
   (iii) රාජ්‍ය ප්‍රතිපත්තිවල ස්වභාවය **හෝ** අන්තර්ජාතික දේශපාලනය තුළ රාජ්‍යයන්ගේ ජාතික ආශාවන් (ලකුණු $10 \times 2 = 20$ යි.)

## C කොටස

5. "ලංකාව වැඩවසම් ක්‍රමයෙන් ධනවාදයට පරිවර්තනය වීමේ ක්‍රියාදාමයට පදනම දැමූයේ කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණය මගිනි." ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 20 යි.)

6. පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** විස්තර කරන්න.
   (i) 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණවල සමාජ-ආර්ථික හා දේශපාලන ප්‍රතිඵල
   (ii) රාජ්‍ය සේවයේ **හෝ** අධිකරණ සේවයේ ස්වාධීනත්වය පවත්වා ගෙනයාම සඳහා සෝල්බරි ව්‍යවස්ථාව මගින් සැපයූ ව්‍යවස්ථාමය ආරක්ෂණ විධිවිධාන
   (iii) අධිකරණ සේවය **හෝ** රාජ්‍ය සේවය පාලනය කිරීම සඳහා 1972 ව්‍යවස්ථාව මගින් සැපයූ ව්‍යවස්ථාමය විධිවිධාන
   (iv) ජනාධිපතිවරයාගේ තත්ත්වය, බලතල හා කාර්ය සම්බන්ධයෙන් 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් සිදු කළ වෙනස්කම් (ලකුණු $10 \times 2 = 20$ යි.)

මෙතැනින් කපා හරින්න

[හයවැනි පිටුව බලන්න.

**7.** පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** විස්තර කරන්න.

(i) ආණ්ඩුකරණය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාර්යභාරය

(ii) මානව හිමිකම් කඩවීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා 1978 ව්‍යවස්ථාව යටතේ ගොඩනැගූ යාන්ත්‍රණය

(iii) රාජ්‍ය සේවයේ අල්ලස් හා දූෂණය මර්දනය කිරීම සඳහා වර්තමාන ආණ්ඩුව ගෙන ඇති පියවර

(iv) අධිකරණයේ ස්වාධීනත්වය පවත්වා ගෙනයාම සඳහා 1978 ව්‍යවස්ථාව මගින් සපයා ඇති ආරක්ෂණ විධිවිධාන

(ලකුණු $10 \times 2 = 20$ යි.)

**8.** පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** පිළිබඳ ව අදහස් දක්වන්න.

(i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්වරයාගේ කාර්යභාරය

(ii) අන්තර්ජාතික මානව හිතවාදී නීතිය වර්ධනය කිරීමෙහිලා අන්තර්ජාතික රතු කුරුස කමිටුවේ කාර්යභාරය

(iii) මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම පිළිබඳ ව අන්තර්ජාතික ක්ෂමා ආයතනයේ කාර්යභාරය

(iv) වර්තමාන ජාතික ආණ්ඩුව යටතේ ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ මූලික ලක්ෂණ (ලකුණු $10 \times 2 = 20$ යි.)

* * *